## කුලියාපිටිය නගරසභාව

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශනඉදිරිපත්කිරීම</u>

සමාලෝචිතවර්ෂයේ මූල්‍ය ප්‍රකාශන2012 මාර්තු 30 දින ද ඉකුත්වර්ෂයටඅදාල මූල්‍ය ප්‍රකාශන2011 අප්‍රේල් 11 දින ද විගණනයටඉදිරිපත්කරතිබූඅතරසමාලෝචිතවර්ෂයේ විගණකාධිපති වාර්තාව2012 සැප්තැම්බර්12දිනසභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 <u>මතය</u>

මාගේපරීක්ෂණයෙන් පෙනීයනඅන්දමටසහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම්අනුවකුලියාපිටිය නගරසභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වර්ෂය සඳහා නිසිගිණුම්වාර්තා පවත්වා ඇති බවත්, සභාපතිවරයාට යවන ලද මාගේවාර්තාවේ දක්වා ඇතිකරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලටවන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනටකුලියාපිටිය නගරසභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳතත්ත්වය සහ එදිනෙන් අවසන්වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල්ප්‍රවාහ ප්‍රකාශසත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත්ගිණුම්කරණ මූලධර්ම වලටඅනුකූලව මූල්‍ය ප්‍රකාශනපිළියෙල කරඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශනපිළිබඳඅදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණඅඩුපාඩු</u>

පහත නිරීක්ෂණයන්කරනු ලැබේ.

(අ). බස් නැවතුම්පලසංවර්ධනය සඳහා ලබාගත්ණය වෙනුවෙන්සමාලෝචිතවර්ෂයටඅදාල රු.1,092,496 ක්වූ ණය වාරික 2 ක් ගෙවා නොතිබුණුඅතර එය ගිණුම්වලින්අනාවරණය කර නොතිබුණි.

(ආ). ආසියානුසංවර්ධන බැංකුවෙන්සාප්පුසංකීර්ණය ඉදිකිරීම සඳහා ලබාගත් ණය සඳහා සමාලෝචිතවර්ෂය අවසානයටඑකී ආයතනයේ ශේෂසනාථකිරීම්අනුව රු.4,651,346 ක ණය ශේෂයක් ගෙවීමට පැවතියද එය ගිණුම්වලින් හෙළිකර නොතිබුණි.

(ඇ) සමාලෝචිතවර්ෂය අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු ලෙස රු.7,819,862ක් දක්වා තිබුණද මුද්දර ගාස්තු හිඟය 2009 වර්ෂය වෙනුවෙන් රු.975,970 ක් හා 2010 වෙනුවෙන් රු.2,768,601 ක් ලෙස රු.3,744,571 ක් විය. ඒඅනුවඑකීවර්ෂ වෙනුවෙන් අධි බිල්කිරීම නිසා රු.4,075,291 ක්සාවද්‍ය ආදායම් ණයගැති ශේෂයක්පැනනැගිතිබුණි.

1.3.2 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

<u>තොරතුරු විගණනයටඉදිරිපත් නොකිරීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයටඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 29,975,331 ක්වූ ගනුදෙනුවිගණනයේදීසතුටුදායක ලෙසසන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශනඅනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.25,387,723 ක්වූ අතර, ඊටඅනුරූපීවඉකුත්වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.20,779,564 ක් විය.

2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලනඅඩුපාඩුනිරීක්ෂණය විය.

(අ). සමාලෝචිතවර්ෂය අවසානයටආපසු ගෙවිය යුතුතැන්පතු යටතේ රු.1,004,056 ක ජල සේවා ඇස්තමේන්තුතැන්පත් දැක්වෙන අතර, පාරිභෝගිකයන්ගෙන්ජලසම්බන්ධතා ලබාදීම සඳහා ලබාගන්නා ලද එකීතැන්පතු මුදල්අදාලකාර්ය නිම වූ පසුවැඩ වාර්තා පිළියෙල කරනිරවුල් නොකරවර්ෂ ගණනාවක සිටඉදිරියට ගෙනඑමින් පැවතුණි.

(ආ). බැංකුගිණුම ක ට අදාලවනිකුත්කලනමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවු රු. 18,000 වටිනා චෙක්පත් 4 ක් පැවතුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින්සමාලෝචිතවර්ෂයටඅදාලවඉදිරිපත්කරතිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනටසමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු000' | රු.000' | රු.000' |
| (i). | වරිපනම් හා බදු | 15,148 | 9,435 | 9,842 |
| (ii). | බදුකුලී | 9,560 | 5,656 | 633 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 12,155 | 12,022 | 258 |
| (iv). | වෙනත් ආදායම් | 47,321 | 20,425 | 9,623 |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත්සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත්බලධාරින්ගෙන්2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුවතිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i). | උසාවි දඩ | 45,750 |
| (ii). | මුද්දර ගාස්තු | 1,897,970 |

2.3.3 <u>වරිපනම්අයකිරීම</u>

සමාලෝචිතවර්ෂය අවසානයටවරිපනම්බදු රු.5,846,323 ක හිඟයක් පැවතිඅතරනියදි පරික්ෂාවඅනුවඑතුල හිඟවරිපනම් යටතේ වීදි 2 කටඅදාල අවස්ථා 18 කදීකාර්තු 07-21 ක පරාසයක විහිදී තිබූ රු.174,554 ක හිඟ ශේෂයක් පැවතිනි. මෙකි හිඟයන්අයකරගැනීම සඳහා නගරසභා ආඥා පනතේ (255 ප්‍රකාරව) 170 වගන්තිය ප්‍රකාරවකටයුතුකරවරෙන්තුනිකුත්කර දේපල තහනම්කිරීමටකටයුතුකර නොතිබුණි.

2.3.4 <u>ජලගාස්තු</u>

ජල ගාස්තු යටතේ හෙට්ටිපොල- කුරුණෑගලපාර පොලිස්නිවාසවලටඅදාලව මාස 11 සිට 41 දක්වා කාලයක්සඳහා රු.70,263 ක්වූ හිඟ ශේෂ 18 ක් පැවතිඅතරජලසැපයුම විසන්ධි කරඇතිජලපාරිභෝගිකයින්ගෙන් රු.12,193 ක්දවශයෙන් රු.82,456 ක හිඟජල ගාස්තු පැවතුණි. එමෙන්ම සමාලෝචිතවර්ෂය අවසානයටජල ගාස්තු යටතේ රු.2,208,561 ක පමණ හිඟයක් පැවතිඅතරඑකී හිඟයන්අයකරගැනීම සඳහා ගිවිසුම්ප්‍රකාරවකටයුතුකර නොතිබුණි.

2.3.5 <u>විනෝද බදු</u>

සමාලෝචිතවර්ෂය අවසානයට හිඟහිටි විනෝද බදු ආදායම රු.1,787,260 ක්වූ අතරවර්ෂයටඅදාලබිල්කිරීම් රු.735,917 ක් විය.

2.4 <u>මානවසම්පත් කළමනාකරණය</u>

පරිපාලන සේවයේ තනතුරක්වූ ලේකම්තනතුරපුරප්පාඩුව පැවතිඅතර එහි වැඩ බැලීම සඳහා කළමනාකරණ සේවයේ අධි පංතියේ නිලධාරිනියක් යොදවා තිබුණි. කම්කරු, මුරකරු, රියදුරු වැනිතනතුරු සඳහා අනුමතකාර්ය මණ්ඩලය 60 ක්වුවද, ඒ යටතේස්ථිර සේවකයින් 52 කුසිටි අතර ආදේශක හා අනියම් ලෙසසභාවෙන්වැටුප්ලබන 70 දෙනෙකුසමාලෝචිතවර්ෂය අවසානය වන විට මේ යටතේඅනුයුක්තව පැවතුණි.

2.5 <u>කොන්ත්‍රාත්පරිපාලනය</u>

පහත නිරීක්ෂණයන්කරනු ලැබේ.

(අ). සමාලෝචිතවර්ෂය තුලවිශාකා මාවත හා දන්ඩගමුව සේවා ස්ථානය අසලපාර හරහා රු.344,720 ක්වැයකර බෝක්කුවක හා කානුවක්ඉදිකරතිබූඅතරකාණුවට හා බෝක්කුවට ඉහලින්ඉදිකරතිබූකානුවල ජලබැස්ම නිසිපරිදිසිදු නොවන බැවින්ඉදිකලකානුවෙන්අදාලඅරමුණුඉටු වී ඇති බවක් 2011 ඔක්තෝබර් 18 දිනසිදුකලස්ථානීය පරීක්ෂාවේදී තහවුරු නොවුණි.

(ආ). සපුමල් මාවත ඉතිරි කොටසකාණුඉදිකිරීමේකර්මාන්තය සඳහා රු.311,805 ක මුදලකට 2011 සැප්තැම්බර්15 දිනගිවිසුම්අත්සන්කරතිබුණද, අසල්වැසියන්ගේවිරෝධතාවයන් හේතුවෙන්අදාලකර්මාන්තය ඉටුකිරීම අත්හැර දමා තිබුණි.

2.6 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පහත නිරීක්ෂණයන්කරනු ලැබේ.

(අ). සමාලෝචිතවර්ෂය අවසානයටහිඟ හිට පැවති රු.208,596 ක සේවක ණය ශේෂය තුල 2000 වර්ෂයේ ස්ථාන මාරුවී ගිය නිළධාරියකුටඅදාළ රු.27,137 ක ණය ශේෂය අයකරගැනිමට නොහැකි වී ඇතිඅතර විශ්‍රාම පාර්තෝෂිකයද සමාලෝචිතවර්ෂය අවසානය වන විට ගෙවා තිබුණි.

(ආ). ඉදිරිපත්කරතිබූ මූල්‍ය ප්‍රකාශනඅනුවසභාවට අයත්ඉඩම් හා ගොඩනැගිලිපිළිබඳ හෙළිකිරීමකසිදුනොවන අතරසභාවවිසින් විධිමත් පරිදිවූ ඉඩම් හා ගොඩනැගිලි ලේඛනයක්දනඩත්තුකර නොතිබුණි. එමෙන්ම කාලානුරූපවඉඩම් හා ගොඩනැගිලිසමීක්ෂණයක්කරසභාවසතු එවැනි දේපලපිළිබඳඅයිතිය තහවුරු කිරීමක් හෝ සිදුකර නොතිබුණි.

(ඇ). කුලියාපිටිය පුස්තකාලයටඅදාලව 2010 භාණ්ඩසමීක්ෂණය සඳහා රු.52,706 ක්වටිනා පොත් 454 ක්ඉදිරිපත් වී නොතිබූඅතරඒසම්බන්ධයෙන්සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ 2012 ජූලි15 වන විටත්ක්‍රියාත්මකකර නොතිබුණි. එමෙන්ම භාණ්ඩසමීක්ෂණවාර්තා අනුව ඉවත්කිරීමටනිර්දේශිතභාණ්ඩවර්ග 72 කටඅදාලඒකක 333 ක්සම්බන්ධයෙන්අදාලපරිදිකටයුතුකර නොතිබුණි.

(ඈ). පළාත්පාලන විශ්‍රාම වැටුප්අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයින්ටඅදාලවසභාවවිසින්එකීඅරමුදලට ගෙවිය යුතු දායක මුදල්නිසිපරිදි නොගෙවීම නිසා සමාලෝචිතවර්ෂය අවසානය වන විටඑකීඅරමුදලට ගෙවිය යුතු ශේෂය රු. 6,423,048 වතිබුණි.

2.7 <u>කාර්ය සාධනය</u>

පහත නිරීක්ෂණයන්කරනු ලැබේ.

(අ). සමාලෝචිතවර්ෂය තුලසභාවේ අයවැය ලේඛනය අනුවඉටුකිරීමටසැළසුම් කරතිබූ රු.11,945,000 ක්වූ ව්‍යාපෘති 21 සමාලෝචිතවර්ෂය තුලඉටුකර නොතිබුණි. සහා බලප්‍රදේශය තුලකිලෝමීටර් 14 ක මාර්ගපද්ධතියක් හා කි.මී.34 ක කාණුපද්ධතියක් පැවතිඅතරඉන් කි.මී.9 ක මාර්ගපද්ධතීන් හා කි.මී.12 ක කානුපද්ධතිනඩත්තුකරතිබුණි.ඊටඅදාලනිමිවැඩ වාර්තා සමාලෝචිතවර්ෂය අවසානය දක්වාම පිළියෙල කර නොතිබුණි.

(ආ). ආයතනයටඅදාලවසංයුක්තසැළැස්මක් හාසමාලෝචිතවර්ෂයටඅදාලක්‍රියාකාර්සැළැස්මක් ද නොතිබුණි.

2.8 අභ්‍යන්තරවිගණනය

-----------------------

සමාලෝචිතවර්ෂයටඅදාලවඅභ්‍යන්තරවිගණන හා කළමනාකරණකමිටුවක්පත්කරතිබුණදඅභ්‍යන්තරවිගණනවැඩසටහන් යටතේප්‍රමාණවත්අභ්‍යන්තරවිගණනයක්සිදුව නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන්පද්ධති හා පාලනක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමණාකරණය

(ඉ) කොන්ත්‍රාත්පරිපාලනය